35/2
214

වගා ආධාර චක්‍ර ලේඛ අංක 60 - A

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

2004/01/08 දින

සියළුම ප්‍රාදේශිය කළමනාකරුවන් වෙත,

**තේ නැවත වගා සහ පාළු සැපයීමේ ආධාරක්‍රම යටතේ**
**2004 වර්ෂය සඳහා කටයුතු කිරීම**

යථෝකත කරුණ පිළිබඳව මාගේ සමාංක සහ 2003/12/30 දිනැති, අංක 60 දරණ වගා දිරි දීමනා චක්‍රලේඛ ලිපියට යොමුවයි.

මෙම මස 02 දින පැවැති ප්‍රාදේශිය කළමනාකරුවන්ගේ රැස්වීමේදි ප්‍රකාශිත අදහස් සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දෙන ලද උපදෙස් සැලකිල්ලට ගනිමින් යථෝක්ත චක්‍රලේඛ ලිපිය පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලද බැව් මෙයින් දැනුම් දෙමි.

1. යථෝක්ත ඉල්ලුම් පත්‍ර නොමිලයේ නිකුත් කිරීමට හා ආපසු භාර ගැනිමේදි රු. 100/- ක ආපසු ගෙවනු නොලබන ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් අයකිරීමට ගන්නා ලද තිරණය මෙයින් අවලංගු කරන අතර වහාම ක්‍රියාත්මක වන පරිදි ඉල්ලුම්පත්‍රය රු. 25/- ක මුදලකට අලෙවි කිරීමටත් ලැබෙන ඉල්ලුම්පත්‍ර වෙනුවෙන් ගාස්තුවක් අයකර නොගෙන කටයුතු කිරීමටත් පියවර ගන්න.

   යථෝක්ත දැනුම් දිම පරිදි යම් හෙයකින් රු. 100/- ක ගාස්තුවක් මේ වන විට ඔබ කාර්යාලයට ගෙවා ඇත් නම් එම මුදල ආපසු ගෙවීමට කටයුතු කරන්න.

2. දැනටමත් ඔබ කාර්යාලයේ ඇති ඉල්ලුම්පත් වහාම ක්‍රියාත්මක වන පරිදි තොග ගණන් ගැනිමත් කර මිල සඳහන් ස්ථානය මත රු. 25/- යන්න පැහැදිලිව පෙනෙන ලෙස මුද්‍රාවක් මගින් සටහන් කිරීමට පියවර ගන්න. උප කාර්යාලවල සහ තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරින් වෙත ඇති ඉල්ලුම් පත්‍ර වෙනුවෙන්ද ඉහත ආකාරයට කටයුතු කරන්න.

3. ලැබෙන ඉල්ලුම් පත්‍ර පරිගණක ගත කිරිමේදි යථෝක්ත චක්‍ර ලේඛයේ අංක 2 යටතේ සඳහන් කරන ලද පරිදි පරිගණක වැඩ සටහන සඳහා ගෙවීම් තොරතුරු ඇතුලත් කරමින් කරන ලද සංශෝධනය අවලංගු කරනු ලැබේ.

4. ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි කිරීම වෙනුවෙන් ගාස්තු අයකිරීමට මුලින් තිරණය කරන ලද්දේ අවසර පත්‍ර හිමිකරුවන් විසින් නියමිත කාල සීමා තුල අදාල එක් එක් කටයුතු අවසාන නොකිරීම නිසා අක්‍රිය වන අවසර පත්‍ර ඉහල ප්‍රතිශතයක් ඇති වීම සැලකිල්ලට ගනිමිනි. පසුගිය 02 වන දින පැවැති ප්‍රාදේශිය කළමනාකරුවන්ගේ සාකච්ඡාවේදි දැඩි ලෙස මේ පිළිබඳව අවධානය යොමු කළ පරිදි එක් එක් තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරී විසින් වග කිමෙන් යුතුව ක්‍රියාකිරීමෙන් සහ නිසි අධීක්ෂණයක් පවත්වාගෙන යාමෙන් එම තත්වය වෙනස් කළ හැකි බවට වූ එකඟතාවය මත මෙම තිරණයට එළඹෙන ලද බැව් සිහිගන්වන අතර 2004 වර්ෂයේ අවසර පත්‍ර සම්බන්ධයෙන් ඒ පරිද්දෙන්ම ක්‍රියා කිරීමට පියවර ගැනිම ඔබගේ වගකිමක් බව මෙහිලා අවධාරණය කරමි.

5. තවද යථෝක්ත රැස්වීමේදී සාකච්ඡා කරන ලද පරිදි තේ නැවත වගා අවසර පත්‍ර යටතේ එම වර්ෂය තුලදීම පස සාරවත් කිරීම සඳහා තෘණ සිටුවීම වෙනුවෙන් දිරි ගැන්වීම උදෙසා දෙනු ලබන ආයුධ කට්ටලය සඳහා 2004 වර්ෂය සඳහා ද ඒකකයකට රු. 1000/- බැගින් ප්‍රතිපාදන ඇතුලත් කර ඇත.

මෙහිදී;

i. නියමිත මිලදී ගැනීම් පරිපාටිය අනුගමනය කරමින් වගා දිරි දීමනා මුල්‍ය රෙගුලාසි අනුව මිලට ගැනීමටත් , අවම පිරිවැයක් තුලින් සමිති හරහා සැපයීමටත් කටයුතු කරන්න.

ii. අවසර පත්‍ර හිමිකරුවකු වෙත එකම ඉඩමක් වෙනුවෙන් කලින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ ආයුධ කට්ටලයක් සපයා ඇති විටක නැවත නිකුත් කෙරෙන අවසර පත්‍රයක් වෙනුවෙන් ආයුධ කට්ටලයක් නිකුත් නොකරන්න.

6. 2004 වර්ෂය සඳහා දිරි දීමනා ක්‍රම ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පිළියෙල කරන ලද භෞතික සහ මුල්‍ය ඇස්තමේන්තු පිටපතක් මේ සමඟ අමුණා ඇත. එහි,

I. කට්ටි වශයෙන් තේ නැවත වගා කිරීම සඳහා වු ආධාර ක්‍රමය සඳහා අවශ්‍ය ප්‍රතිපාදනද තේ නැවත වගා කිරීමේ ආධාර ක්‍රමය සමඟ ඒකාබද්ධ කර තිබේ. ඒ අනුව 2001/11/19 දිනැති වගා ආධාර චක්‍ර ලේඛ අංක 58 හි සඳහන් ක්‍රියාමාර්ගය තව දුරටත් අනුගමනය කළ හැකි අතර ඒ වෙනුවෙන් ඉහත අංක 05 යටතේ සඳහන් ආයුධ කට්ටලය හිමි නොවේ.

II. අළුතින් තේ වගා කිරීම යටතේ ප්‍රතිපාදන ඇතුලත් කර ඇත්තේ සං/ව.ආ/ප්‍රති සහ 2003/08/26 දිනැති ලිපිය පරිදි රත්නපුර සහ කළුතර කාර්යාලවල 2003 වර්ෂය ඇතුලත වගා කළ බවට දැනටමත් හඳුනාගෙන ඇති හා 2003 වර්ෂයේ මුදල් ප්‍රතිපාදන සීමා මත ගෙවීම් කිරීමට නොහැකි වු අවසර පත්‍ර වෙනුවෙන් ගෙවීමට පමණකි.

ඉහත සඳහන් සංශෝධන ඔබ කාර්යාල මණ්ඩලයේ අදාල සියළු දෙනා වෙත දැනුම් දීමට කටයුතු කරන්න.

අත්සන් කලේ :
එම්.එල්.එම්. අබුසාලි
**සභාපති**

එච්.පී.පී හේවගේ
**සාමාන්‍යාධිකාරී**

**පිටපත් -**

I. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන / ව්‍යාප්ති)
II. සහකාර සාමාන්‍යාධිකාරී (පාලන /පිරිස්)
III. අභ්‍යන්තර විගණක
IV. මුදල් කළමනාකරු
V. සහකාර සාමාන්‍යාධිකාරී (සේවා)
VI. ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල සියළුම මාණ්ඩලික නිලධාරීන්